

ගඩ

CED Sri Lanka
Quality Education For All
අධ්‍යාපන සංවර්ධන සන'ධානය

CED තෛමාසික පුවත් සඟරාව

තෛමාසික අධ්‍යාපනික පුවත් සඟරාව 2026 සැප්තැම්බර් කලාපය



ජීවිත කාලීන ඉගෙනුම් අයිතියක් ලෙස වැඩිහිටි අධ්‍යාපනය

මානව සංවර්ධන දර්ශකය ගණනය කරන එක් නිර්නායකයක් වන්නේ අධ්‍යාපනයයි. අධ්‍යාපනය රටක අතීතය, වර්තමානය හා අනාගතය තීරණය කිරීමෙහිලා විශාල කාර්යය භාරයක් සිදු කරයි. ඒ අනුව අධ්‍යාපනය පුළුල් සංකල්පයක් වන අතර ඒ සම්බන්ධයෙන් විවිධ අදහස් ඉදිරිපත් වී ඇත. ඒ අනුව අධ්‍යාපනය යනු, පුද්ගලයෙකුගේ දැනුම, කුසලතා, ආකල්ප, වටිනාකම් සහ හැසිරීම් වර්ධනය කරමින්, පෞද්ගලික ජීවිතය, සමාජය සහ වෘත්තීය ජීවිතය තුළ සාර්ථකව ක්‍රියා කිරීමට අවශ්‍ය හැකියාවන් ගොඩනංවන අඛණ්ඩ ඉගෙනුම් ක්‍රියාවලියකි. එය පුද්ගල සංවර්ධනයට පමණක් නොව සමාජීය, සංස්කෘතික, ආර්ථික සහ ප්‍රජාතන්ත්‍රවාදී සංවර්ධනයට ද දායක වේ.

අධ්‍යාපනය යනු, පුළුල් සංකල්පයක් වන අතර එය ප්‍රධාන වශයෙන් විවිධ අධ්‍යාපන ක්‍රම, ඉගෙනුම් අංශ සහ අධ්‍යාපන මට්ටම් ලෙස වර්ගීකරණය කළ හැකිය. අධ්‍යාපනයේ ප්‍රධාන ආකාර වන්නේ විධිමත් අධ්‍යාපනය (Formal Education), නොවිධිමත් අධ්‍යාපනය

3 වන පිටුවට

ඇතුළත

- ජීවිත කාලීන ඉගෙනුම් අයිතියක් ලෙස වැඩිහිටි අධ්‍යාපනය — 1
- අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ නව සාමාජිකයින් බැඳවා ගැනීම — 2
- කාම්බෝජයේ ගුරුවරුන් දේශගුණික විපර්යාස පිළිබඳ අධ්‍යාපනය පන්ති කාමරවලට ගෙන ඒමට සූදානම් වෙයි — 6
- ළමුන්ගේ දැඟකම යනු — 7
- කෘත්‍රිම බුද්ධිය සහ අධ්‍යාපනය පිළිබඳ තරුණ ප්‍රජාව සවිබල ගැන්වීමේ වැඩසටහන — 09
- අධ්‍යාපන සෑලසුම්කරණය සඳහා සහභාගීත්ව ප්‍රවේශය සහ සාමාන්‍ය අධ්‍යාපන අංශ ප්‍රතිව්‍යුහගත රාමුව (GESTF) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන දකුණු පළාතේ දී — 09
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ පළාත් හඬ, ජාතික සංවාදයට — 11
- අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැයකරණය සහ මූල්‍යකරණය පිළිබඳ ධාරිතා වැඩසටහන — 12

අපේ දැක්ම

ජාති, ආගම්, කුල, භාෂා, සමාජ සහ ආබාධිත තත්ත්වයන් නොසළකා සියලු දෙනාටම ගුණාත්මක හා සමාන අධ්‍යාපන අවස්ථාවන් සහතික කිරීම.

අපේ මෙහෙවර

සියලු දෙනාටම ගුණාත්මක සහ සමාන අවස්ථා සහිත අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සිවිල් සමාජ සංවිධාන හා පුරවැසියන් මැදිහත්වීම පිණිස බලපෑම් කිරීම හා

දිරිගැන්වීම ද අධ්‍යාපනික සංවර්ධනය උසස්ම ප්‍රමිතීන්ගෙන් යුතුව ලබා ගැනීමට සිවිල් සංවිධාන හා පුද්ගලයන් දිරිමත් කිරීම

අපගේ අරමුණු

1. සැමට ගුණාත්මක හා සම අධ්‍යාපනයකට අවස්ථාවන් සළසන ජාතික හා පළාත් අධ්‍යාපන ප්‍රතිපත්තීන් සිවිල් සමාජ සංවිධානයන්ගේ දායකත්වය ගෙන ඒමට හා ක්‍රියාත්මක කිරීමට බලපෑම් කිරීම සහ එය ප්‍රවර්ධනය කිරීම.
2. හැකි උපරිම මට්ටමින් ජාතික අවශ්‍යතාවන් සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති, ප්‍රතිසංස්කරණ සහ සැළසුම් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට බලපෑම් හා පෙළඹ වීම් කිරීම.
3. කිසිවෙකුත් මඟ නොහැරෙන ආකාරයෙන් සහ සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය අන්තර්ගත වන පරිදි අධ්‍යාපන සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය පිණිස සියලුම මට්ටම්වල සිවිල් සංවිධාන කණ්ඩායම්වල සහ ජාලයන්ගේ කුසලතාවන් ශක්තිමත් කිරීම.
4. ගුණාත්මක සහ සාධාරණ අධ්‍යාපනයක් සහතික කිරීම උදෙසා අධ්‍යාපන ප්‍රතිපත්ති, සැලසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය කිරීම සහ නිර්දේශයන් සිදු කිරීම.

අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ නව සාමාජිකයින් බඳවා ගැනීම

අධ්‍යාපන සංවර්ධන සන්ධානය තම සාමාජික සංවිධාන සංඛ්‍යාව ඉහළ නැංවීමට අපේක්ෂා කරනු ලබයි. විශේෂයෙන් **උතුර, නැගෙනහිර, පළාත්වල ද, කොළඹ, ගම්පහ, අනුරාධපුරය, ගාල්ල, හම්බන්තොට, මහනුවර, කෑගල්ල යන දිස්ත්‍රික්කවල** ද, අධ්‍යාපන සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීව සම්බන්ධවීමට රුචිකත්වයක් දක්වන සිවිල් සංවිධාන වලට/පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය. සාමාජිකත්වය ලබාගැනීම සඳහා පහත දැක්වෙන අවම සුදුසුකම් සපුරාලිය යුතු වේ.

1 **අධ්‍යාපනය සම්බන්ධයෙන් ස්වේච්ඡාවෙන් වැඩකරන පළපුරුදු තරුණ හෝ කාන්තා හෝ වැවිලි/ධීවර ආදී ප්‍රජාව හෝ විශේෂ අවශ්‍යතා සහිත දරුවන්/ ප්‍රජාව නියෝජනය කරන සංවිධානයක් වීම.**

සහ

2 **අධ්‍යාපනය සම්බන්ධයෙන් ස්වේච්ඡාවෙන් වැඩකරන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හෝ ජාතික රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වීම.**

අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සාමාජිකත්වය පිරිනැමීමේ අවසන් තීරණාත්මක බලය අධ්‍යක්ෂක මණ්ඩලය සතු බව කරුණාවෙන් සලකන්න. වැඩිදුර තොරතුරු සඳහා දුරකතන අංකය 0112887642 ඔස්සේ අප අමතන්න නැත්නම් අපට ලියන්න. අපගේ ලිපිනය: අධ්‍යාපන සංවර්ධන සන්ධානය, නො.17, ධර්මපාල පෙදෙස, රාජගිරිය

සංස්කාරක සටහන

මෙහි පළවන ලිපිවල අන්තර්ගත කරුණුවල දැක්වෙන අදහස් සහ මත එම ලිපිවල කතෘවරුන් පෞද්ගලික වශයෙන් දරණ ඒවාය. ඒවායේ අන්තර්ගත කරුණු සහ අදහස් අත්‍යාවශ්‍යයෙන් ම අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ අදහස් නොවන බව කරුණාවෙන් සළකන්න.

අධ්‍යාපන සංවර්ධන සන්ධානය
නො. 17, ධර්මපාල මාවත,
රාජගිරිය.

සංස්කාරක මණ්ඩලය
එස්.ආර්.ඩබ්.එම්. මංගල ලාල් සත්කුමාර මහතා
කේ. ඒ. ගුණරත්න මහතා
එන්. නගුලේශ්වරි මහත්මිය

(Non-formal Education) හා අවිධිමත් ඉගෙනුම/ අධ්‍යාපනය (Informal Learning / Education) යන්නය. විධිමත් අධ්‍යාපනය යනු, පාසල්, විශ්වවිද්‍යාල සහ පිළිගත් අධ්‍යාපන ආයතන තුළ නිශ්චිත විෂයමාලා, කාලසටහන් සහ ඇගයීම් ක්‍රම යටතේ ලබාදෙන අධ්‍යාපනයයි. නොවිධිමත් අධ්‍යාපනය යනු, විධිමත් අධ්‍යාපන පද්ධතියෙන් පිටත සැලසුම් සහගතව සංවිධානය කරන පාඨමාලා, පුහුණු වැඩසටහන්, ප්‍රජා අධ්‍යාපනය සහ වැඩිහිටි අධ්‍යාපන වැඩසටහන් මෙයට අයත් වේ. අවිධිමත් අධ්‍යාපනය යනු, පවුල, රැකියා ස්ථානය, මිතුරන්, ප්‍රජාව, සමාජ මාධ්‍ය සහ දෛනික ජීවිත අත්දැකීම් තුළින් ස්වභාවිකව සිදුවන ඉගෙනුමයි. එම අධ්‍යාපන ප්‍රවේශකත්ව ආකාරයන් හරහා ඕනෑම අධ්‍යාපන මට්ටමකට ලගා වීමේ හැකියාව පුරවැසියාට පවතී. ඒ අනුව, අධ්‍යාපනය ලබාගත හැකි මට්ටම් ලෙස, ප්‍රාථමික අධ්‍යාපනය (Primary Education), ද්විතියික අධ්‍යාපනය (Secondary Education), උසස් අධ්‍යාපනය (Higher Education), වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනය (Technical and Vocational Education and Training), වැඩිහිටි අධ්‍යාපනය (Adult Education), ජීවිත කාලීන අධ්‍යාපනය (Lifelong Learning), විශේෂ අධ්‍යාපනය (Special Education) හා ප්‍රජා අධ්‍යාපනය (Community Education) හඳුනාගත හැකිය.

තවද, UNESCO හි 1996 Delors Report අනුව අධ්‍යාපනය ප්‍රධාන ඉගෙනුම් කුලුනු හතරක් මත පදනම් වේ. ඒවානම්,

1. ඉගෙන ගැනීමට ඉගෙනීම (Learning to Know) - දැනුම ලබාගැනීම සහ අවබෝධය වර්ධනය කිරීම.
2. ක්‍රියා කිරීමට ඉගෙනීම (Learning to Do) - ප්‍රායෝගික හා වෘත්තීය කුසලතා වර්ධනය කිරීම.
3. එකට ජීවත් වීමට ඉගෙනීම (Learning to Live Together) - සහජීවනය, සහයෝගීතාව සහ අන්‍යෝන්‍ය ගෞරවය වර්ධනය කිරීම.
4. පුද්ගලයෙකු ලෙස වර්ධනය වීමට ඉගෙනීම (Learning to Be) - පෞරුෂය, නිර්මාණශීලීත්වය සහ ස්වාධීන චින්තනය වර්ධනය කිරීම.

ජීවිත කාලය පුරා අධ්‍යාපනය යන සංකල්පය තුලින් පැහැදිලි වන්නේ උපතේ සිට මරණය දක්වා වූ කාලය තුළ අධ්‍යාපනය ලැබීමේ හෝ අධ්‍යාපනය ලබා ගැනීමේ අවස්ථාවන්ය. එකී අවස්ථාවන් තුළ එක් කාල පරිච්ඡේදයක් ලෙස මෙම වැඩිහිටි අධ්‍යාපනය යන සංකල්පය හඳුනාගත හැකිය. වැඩිහිටි අධ්‍යාපනය සම්බන්ධයෙන් විවිධ නිර්වචන ඉදිරිපත් වී ඇත. ඒ අනුව,

UNESCO සංවිධානය අනුව, **වැඩිහිටි අධ්‍යාපනය යනු ජීවිත කාලය පුරා අඛණ්ඩව සිදුවන ඉගෙනුම් ක්‍රියාවලියේ මූලික අංගයකි. වැඩිහිටියන්ට සමාජය තුළ සහ රැකියා ක්ෂේත්‍රය තුළ සක්‍රීයව සහභාගී වීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ හැකියාවන් වර්ධනය කිරීම අරමුණු කරගත් විධිමත් (Formal), අවිධිමත් (Non-formal) සහ අවිධිගත: (Informal) සියලුම ඉගෙනුම් ක්‍රියාවලීන් මෙයට ඇතුළත් වේ.**

UNESCO, 2015)

යුරෝපීය කොමිසමට අනුව, වැඩිහිටි ඉගෙනුම යනු පුද්ගලයෙකුගේ මූලික අධ්‍යාපනය සහ පුහුණුව අවසන් කිරීමෙන් පසුව, ඔහුගේ හෝ ඇයගේ ජීවිත කාලය තුළ සිදුකරනු ලබන සියලුම ආකාරයේ ඉගෙනුම් ක්‍රියාකාරකම් වේ. මෙයට දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීම, වෘත්තීය සංවර්ධනය සහ පුද්ගල සංවර්ධනය ඇතුළත් වේ.

(European Commission, 2006)

UNESCO සංවිධානය ජීවිත කාලීන ඉගෙනුම් ආයතනයට අනුව, වැඩිහිටි අධ්‍යාපනය යනු සාක්ෂරතාව, මූලික කුසලතා, වෘත්තීය පුහුණුව, අඛණ්ඩ අධ්‍යාපනය සහ ප්‍රජා අධ්‍යාපනය තුළින් වැඩිහිටියන්ගේ පුද්ගලික, වෘත්තීය සහ සමාජීය හැකියාවන් වර්ධනය කිරීම සඳහා ලබාදෙන ඉගෙනුම් අවස්ථා සමූහයකි.

(UNESCO Institute for Lifelong Learning, 2016)

සමස්තයක් ලෙස, වැඩිහිටි අධ්‍යාපනය යනු පුද්ගලයන්ගේ ජීවිත කාලය පුරා අඛණ්ඩව සිදුවන ඉගෙනුම් ක්‍රියාවලියක් වන අතර, එමඟින් ඔවුන්ගේ දැනුම, කුසලතා, ආකල්ප සහ වෘත්තීය හැකියාවන් සංවර්ධනය කරමින් පුද්ගලික ජීවිතය, රැකියා ක්ෂේත්‍රය සහ සමාජීය සංවර්ධනය සඳහා සක්‍රීයව දායක වීමට අවස්ථාව සලසයි.

උක්ත නිර්වචන අනුව පෙනී යන්නේ, වැඩිහිටි අධ්‍යාපනය, අධ්‍යාපන ක්ෂේත්‍රයේ වඩා වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන බවයි. නූතන සමාජය තුළ සිදුවන ආර්ථික, සමාජීය, දේශපාලනික සහ තාක්ෂණික වෙනස්වීම් හමුවේ පුද්ගලයන්ට තම දැනුම හා කුසලතා අඛණ්ඩව යාවත්කාලීන කර ගැනීමේ අවශ්‍යතාව පවතී. විශේෂයෙන්ම ගෝලීයකරණය, ඩිජිටල් තාක්ෂණයේ වේගවත් ව්‍යාප්තිය, කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence), රැකියා වෙළෙඳපොළේ වෙනස්වීම් සහ නව ආර්ථික රටාවන් හමුවේ පාසල් අධ්‍යාපනයෙන් හෝ විධිමත් අධ්‍යාපනයෙන් පමණක් පුද්ගලයෙකුගේ ජීවිත කාලය පුරා පවතින සියලුම ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීම අපහසු වී ඇත. එබැවින් පුද්ගලයන්ට තම ජීවිතයේ විවිධ අවස්ථාවලදී නව දැනුම, කුසලතා සහ නිපුණතා අත්පත් කර ගැනීමට අවස්ථාව සලසන වැඩිහිටි අධ්‍යාපනය වර්තමානයේ අත්‍යවශ්‍ය අධ්‍යාපනික ප්‍රවේශයක් බවට පත්ව තිබේ.

වැඩිහිටි අධ්‍යාපනය පුද්ගලයාගේ රැකියා හැකියාව හා ආදායම් උත්පාදන හැකියාව වැඩිදියුණු කිරීමට පමණක් සීමා නොවන අතර එය පුද්ගලයාගේ ආත්ම විශ්වාසය, ස්වාධීන තීරණ ගැනීමේ හැකියාව, සමාජීය සබඳතා, පවුල් ජීවිතය සහ ප්‍රජා සහභාගීත්වය ශක්තිමත් කිරීමට ද දායක වේ. එසේම සමාජ අසමානතා අවම කිරීම, කාන්තා සවිබලගැන්වීම, දරිද්‍රතාව අවම කිරීම, ප්‍රජා සංවර්ධනය සහ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ගොඩනැගීම සඳහා ද වැඩිහිටි අධ්‍යාපනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

වැඩිහිටි අධ්‍යාපනය යනු එක් විෂය ක්ෂේත්‍රයකට හෝ සාක්ෂරතාව වර්ධනය කිරීමට පමණක් සීමා වූ ක්‍රියාවලියක් නොවේ. වැඩිහිටියන්ගේ විවිධ ඉගෙනුම් අවශ්‍යතා, සමාජීය පසුබිම්, වයස් මට්ටම් සහ ආර්ථික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ එය ක්‍රියාත්මක කළ යුතුය. ඒ අනුව වැඩිහිටි අධ්‍යාපනයේදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර කිහිපයක් හඳුනාගත හැකිය.

1. සාක්ෂරතාව හා මූලික අධ්‍යාපනය (Literacy and Basic Education)
2. වෘත්තීය අධ්‍යාපනය හා කුසලතා සංවර්ධනය (Vocational Education and Skills Development)
3. ඩිජිටල් සාක්ෂරතාව හා තාක්ෂණික අධ්‍යාපනය (Digital Literacy and Technology Education)
4. සෞඛ්‍ය, මූල්‍ය සාක්ෂරතාව හා යහපැවැත්ම පිළිබඳ අධ්‍යාපනය (Health Education, Finance Literacy and Well-being)
5. ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් හා පුරවැසි අධ්‍යාපනය (Democracy, Human Rights and Citizenship Education)
6. පරිසර අධ්‍යාපනය හා තිරසර සංවර්ධනය (Environmental Education and Sustainable Development)
7. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව හා සමාජීය අන්තර්කරණය (Gender Equality and Social Inclusion)
8. ප්‍රජා අධ්‍යාපනය හා සාමය ගොඩනැගීම (Community Education and Peace building)

ඉහත ක්ෂේත්‍ර මඟින් පැහැදිලි වන්නේ වැඩිහිටි අධ්‍යාපනය පුළුල් හා බහුවිධ ක්‍රියාවලියක් වන බවයි. UNESCO විසින් 2015 වසරේ සම්මත කරන ලද Recommendation on Adult Learning and Education ලේඛනය තුළ ද සාක්ෂරතාව හා මූලික කුසලතා, අඛණ්ඩ අධ්‍යාපනය හා වෘත්තීය කුසලතා, ප්‍රජා අධ්‍යාපනය සහ පුරවැසි කුසලතා යන ප්‍රධාන ඉගෙනුම් ක්ෂේත්‍ර තුන හඳුනාගෙන ඇත (UNESCO, 2015).

ශ්‍රී ලංකාව තුළ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය මඟින් පාසල් සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන තිබුණ ද, සියලුම පුරවැසියන්ගේ ජීවිත කාලීන ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීම සඳහා තවදුරටත් අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර පවතී. විශේෂයෙන්ම පාසල් අධ්‍යාපනය අතරමඟ නතර කළ පුද්ගලයන්, අඩු ආදායම්ලාභී පවුල්, වතුකර ප්‍රජාව, ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන පුද්ගලයන්, රැකියා විරහිත තරුණ හා වැඩිහිටි ජනතාව සහ තාක්ෂණික දැනුමෙන් ඈත්ව සිටින කණ්ඩායම් සඳහා අඛණ්ඩ ඉගෙනුම් අවස්ථා පුළුල් කිරීමේ අවශ්‍යතාව පවතී. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථික පරිවර්තනය, රැකියා වෙළෙඳපොළේ වෙනස්වීම් සහ ඩිජිටල් ආර්ථිකයේ වර්ධනය හමුවේ වැඩිහිටියන්ට නව වෘත්තීය කුසලතා ලබාගැනීමේ අවස්ථා සලසා දිය යුතුය. සාම්ප්‍රදායික රැකියා ක්ෂේත්‍රවල නිරත පුද්ගලයන්ට නව තාක්ෂණික ක්‍රමවේද හඳුන්වාදීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ව්‍යාපාරික දැනුම වර්ධනය කිරීම සහ කාන්තාවන්ගේ ආර්ථික සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා වැඩිහිටි අධ්‍යාපන වැඩසටහන් යොදාගත හැකිය.

එසේම ශ්‍රී ලංකාව බහු ආගමික සමාජයක සාමය, සහජීවනය සහ සමාජීය ඒකාබද්ධතාව ගොඩනැගීම සඳහා වැඩිහිටි අධ්‍යාපනයට විශේෂ කාර්යභාරයක් පැවරේ. විවිධ ප්‍රජාවන් අතර අන්‍යෝන්‍ය අවබෝධය, මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් සහ සමාජීය වගකීම් පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා ප්‍රජා මට්ටමේ ඉගෙනුම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැදගත් වේ. අනෙක් අතට ග්‍රාමීය මට්ටමේ මෙන්ම නාගරික මට්ටමේ ද ප්‍රබල වශයෙන් ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගැනීම් හා පිරමිඩ වැනි අවිධිමත් ක්‍රම හරහා මුදල් ඉපයීමට ප්‍රවේශවීම හා ගනුදෙනු කිරීමට වැඩිහිටි ප්‍රජාව යොමු වීම හඳුනාගත හැකිය. එමගින් සමාජ හා ආර්ථික වශයෙන් පිඩාවට ලක්වීමත්, මූල්‍යමය වශයෙන් අස්ථාවර වීමටත් හේතු වේ. මේ අනුව, ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනතාවට මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය වේ. එසේම, ඩිජිටල් සාක්ෂරතාවය පිළිබඳ අවබෝධයක් නොමැතිකම ද අභියෝගයක්ව පවතී. ඒ කෙරෙහි අවධානය යොමු කිරීමද වැදගත් වේ. ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව තුළ ද විධිමත් අධ්‍යාපන පද්ධතියෙන් බැහැරව සිදුවන නොවිධිමත් අධ්‍යාපනය, වැඩිහිටි අධ්‍යාපනය සහ අඛණ්ඩ ඉගෙනුම් අවස්ථා පිළිබඳ අවධානය යොමු කර ඇත. ඒ අනුව වැඩිහිටි අධ්‍යාපනය ජාතික අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලියේ වැදගත් අංගයක් ලෙස තවදුරටත් ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව තුළ වැඩිහිටි අධ්‍යාපනය සහ ජීවිත කාලීන ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන කිහිපයක් දායකත්වය සපයනු ලබයි. ඒ අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ අවිධිමත් හා විශේෂ අධ්‍යාපන අංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රජා ඉගෙනුම් මධ්‍යස්ථාන (Community Learning Centres), ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (Open University of Sri Lanka), වෘත්තීය පුහුණු අධිකාරිය (Vocational Training Authorμty - VTA), ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) සහ තාක්ෂණික විද්‍යාල ප්‍රධාන වේ. මෙම ආයතන මඟින් වැඩිහිටියන් සඳහා මූලික සාක්ෂරතාව, දෙවන අවස්ථා අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, වෘත්තීය හා තාක්ෂණික පුහුණුව, ඩිජිටල් කුසලතා සහ ව්‍යවසායකත්ව සංවර්ධනය වැනි විවිධ ඉගෙනුම් අවස්ථා සලසා දෙනු ලබයි. එසේම රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සමාජ සංවිධාන සහ ප්‍රජා මූලික සංවිධාන ද ග්‍රාමීය, වතුකර සහ සමාජීය වශයෙන් අවාසිසහගත ප්‍රජාවන් ඉලක්ක කරගනිමින් සාක්ෂරතාව, ජීවන කුසලතා, කාන්තා සවිබලගැන්වීම, ප්‍රජා නායකත්වය සහ සමාජීය දැනුවත්භාවය වර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. කෙසේ වෙතත්, මෙම ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම, වැඩිහිටියන්ගේ සැබෑ ඉගෙනුම් අවශ්‍යතාවලට ගැළපෙන වැඩසටහන් සැලසුම් කිරීම, ප්‍රවේශ අවස්ථා පුළුල් කිරීම සහ ප්‍රමාණවත් මූල්‍ය හා මානව සම්පත් වෙන් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ වැඩිහිටි

අධ්‍යාපන පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව පවතී.

වැඩිහිටි අධ්‍යාපනයේ වැදගත්කම පිළිගනු ලැබුව ද, එය ඵලදායී හා සාධාරණ ලෙස ක්‍රියාත්මක කිරීමේදී විවිධ ආර්ථික, සමාජීය, තාක්ෂණික හා ආයතනික අභියෝග පවතී. විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී පවුල්වල වැඩිහිටියන්ට ප්‍රවාහන වියදම්, ඉගෙනුම් ද්‍රව්‍ය සහ අනෙකුත් වියදම් දැරීමේ අපහසුතා හේතුවෙන් අධ්‍යාපන වැඩසටහන් සඳහා සහභාගී වීම සීමා වේ. එසේම රැකියා, පවුල් වගකීම් සහ ගෘහස්ථ කටයුතු හේතුවෙන් ඉගෙනුම් කටයුතු සඳහා ප්‍රමාණවත් කාලයක් වෙන්කර ගැනීමට නොහැකි වීම ද ප්‍රධාන බාධාවකි. අන්තර්ජාල පහසුකම්, ඩිජිටල් උපකරණ සහ තාක්ෂණික දැනුම නොමැතිකම නිසා ඇතැම් වැඩිහිටියන්ට මාර්ගගත ඉගෙනුම් අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමට ද අපහසු වේ. තවද වයස, ස්ත්‍රී පුරුෂභාවය, භාෂාව, ආබාධිතභාවය සහ සමාජීය ආකල්ප මත පදනම් වූ වෙනස්කම් හේතුවෙන් ඇතැම් කණ්ඩායම්වලට අධ්‍යාපන අවස්ථා සඳහා සමාන ප්‍රවේශයක් ලබාගැනීම සීමා වේ. මේ අතර, වැඩිහිටි අධ්‍යාපනය සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය සහ සිවිල් සමාජ සංවිධාන අතර ප්‍රමාණවත් ප්‍රතිපත්තිමය සහ ආයතනික සම්බන්ධීකරණයක් නොමැති වීම ද සැලකිය යුතු ගැටලුවකි. වැඩිහිටියන්ගේ සැබෑ ඉගෙනුම් අවශ්‍යතා, වෘත්තීය පසුබිම සහ ජීවන අත්දැකීම් සැලකිල්ලට නොගෙන අධ්‍යාපන වැඩසටහන් සැලසුම් කිරීම හේතුවෙන් ඒවායේ ගුණාත්මකභාවය හා ඵලදායීතාව ද සීමා විය හැකිය. එබැවින් මෙම අභියෝග අවම කිරීම සඳහා වැඩිහිටියන්ට නම්‍යශීලී, ප්‍රවේශ විය හැකි, ඇතුළත්කාරී සහ ඔවුන්ගේ අවශ්‍යතාවලට ගැළපෙන ඉගෙනුම් අවස්ථා නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය වේ.

වැඩිහිටි අධ්‍යාපනය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ආයතන, අධ්‍යාපන ආයතන, පෞද්ගලික අංශය, සිවිල් සමාජ සංවිධාන සහ ප්‍රජාවන් ඒකාබද්ධව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පහත යෝජනා ඉදිරිපත් කළ හැකිය.

1. ජාතික ප්‍රතිපත්තියක් ශක්තිමත් කිරීම: වැඩිහිටි අධ්‍යාපනය සහ ජීවිත කාලීන ඉගෙනුම සම්බන්ධයෙන් පැහැදිලි ජාතික ප්‍රතිපත්තියක්, ක්‍රියාකාරී සැලැස්මක් සහ අධීක්ෂණ ක්‍රමවේදයක් ශක්තිමත් කළ යුතුය.
2. ප්‍රජා ඉගෙනුම් මධ්‍යස්ථාන පිහිටුවීම: ග්‍රාමීය, වතුකර සහ නාගරික ප්‍රජාවන් ඉලක්ක කරගනිමින් ප්‍රජා ඉගෙනුම් මධ්‍යස්ථාන (Community Learning Centres) ස්ථාපිත කිරීම සහ පවතින මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම කළ යුතුය.
3. ඩිජිටල් හා කෘත්‍රිම බුද්ධි සාක්ෂරතාව ප්‍රවර්ධනය: වැඩිහිටියන් සඳහා මූලික ඩිජිටල් කුසලතා, තොරතුරු සාක්ෂරතාව, සයිබර් ආරක්ෂාව සහ කෘත්‍රිම බුද්ධිය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.
4. වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම: රැකියා වෙළෙඳපොළේ අවශ්‍යතා හඳුනාගෙන වැඩිහිටියන් සඳහා නම්‍යශීලී වෘත්තීය පුහුණු, ව්‍යවසායකත්ව සහ ස්වයං රැකියා සංවර්ධන වැඩසටහන් හඳුන්වාදිය යුතුය.
5. අධ්‍යාපන මූල්‍ය ප්‍රතිපාදන වැඩි කිරීම: වැඩිහිටි අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම සහ රාජ්‍ය නොවන ආයතන, සංවර්ධන හවුල්කරුවන් හා පෞද්ගලික අංශය සමඟ සහයෝගීතා වැඩිදියුණු කළ යුතුය.
6. සිවිල් සමාජ සංවිධානවල දායකත්වය ශක්තිමත් කිරීම: ප්‍රජා මට්ටමේ අධ්‍යාපන අවශ්‍යතා හඳුනාගැනීම, දැනුවත් කිරීම, පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිපත්තිමය සංවාද සඳහා සිවිල් සමාජ සංවිධාන සක්‍රීයව සම්බන්ධ කරගත යුතුය.
7. අවිධිමත් හා අවිධිමත් නොවන ඉගෙනුම පිළිගැනීම: රැකියා ස්ථාන, ප්‍රජා ක්‍රියාකාරකම් සහ ජීවිත අත්දැකීම් තුළින් ලබාගන්නා දැනුම හා කුසලතා ඇගයීම සහ ඒවාට සුදුසු පිළිගැනීමක් ලබාදීමේ ක්‍රමවේද හඳුන්වාදිය යුතුය.
8. පර්යේෂණ හා දත්ත පද්ධති සංවර්ධනය: වැඩිහිටි අධ්‍යාපනයට සහභාගී වන පුද්ගලයන්ගේ සංඛ්‍යාව, ඉගෙනුම් අවශ්‍යතා, ප්‍රවේශ බාධා සහ වැඩසටහන්වල ප්‍රතිඵල පිළිබඳ විධිමත් දත්ත හා පර්යේෂණ පද්ධතියක් ගොඩනැගිය යුතුය.

සමස්තයක් ලෙස සලකා බැලීමේදී වැඩිහිටි අධ්‍යාපනය යනු පුද්ගලයෙකුගේ ජීවිතයේ එක් අවධියකට හෝ නිශ්චිත අධ්‍යාපන මට්ටමකට සීමා නොවන අඛණ්ඩ හා පරිවර්තනීය ඉගෙනුම් ක්‍රියාවලියකි. එය පුද්ගලයන්ගේ දැනුම, කුසලතා හා හැකියාවන් වර්ධනය කිරීමෙන් ඔබ්බට ගොස් සමාජීය සාධාරණත්වය, ආර්ථික සංවර්ධනය, ප්‍රජාතන්ත්‍රවාදය, සාමය සහ තිරසර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමට ද දායක වේ. විශේෂයෙන්ම වේගයෙන් වෙනස් වන ලෝකය තුළ පුද්ගලයන්ට නව අභියෝගවලට මුහුණදීමටත්, වෙනස්වන රැකියා වෙළෙඳපොළට අනුවර්තනය වීමටත්, තාක්ෂණික දියුණුවෙන් ප්‍රයෝජන ගැනීමටත් අඛණ්ඩ ඉගෙනුම් අවස්ථා අවශ්‍ය වේ. එබැවින් වැඩිහිටි අධ්‍යාපනය සුබසාධනමය හෝ අතිරේක අධ්‍යාපනික වැඩසටහනක් ලෙස නොව, සෑම පුද්ගලයෙකුටම හිමි අධ්‍යාපන අයිතියේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස පිළිගත යුතුය.

ඒ අනුව ශ්‍රී ලංකාව තුළ වැඩිහිටි අධ්‍යාපනය ශක්තිමත් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති, ප්‍රමාණවත් මූල්‍ය ආයෝජන, ආයතනික සම්බන්ධීකරණය සහ ප්‍රජා මට්ටමේ සහභාගීත්වය තවදුරටත් වර්ධනය කිරීම අවශ්‍ය වේ. අධ්‍යාපනය යනු ළමා වියෙන් හෝ පාසල් අධ්‍යාපනයෙන් අවසන් වන ක්‍රියාවලියක් නොව, මිනිසාගේ මුළු ජීවිත කාලය පුරාම අඛණ්ඩව පවත්වාගෙන යා යුතු අයිතියක් හා අවශ්‍යතාවක් බව යටෝක්ත කරුණු අනුව මනාව පැහැදිලි වේ.

කේ.ඒ. රංගනී ලක්මාලි
අධ්‍යාපන සංවර්ධන සන්ධානය

කාම්බෝජයේ ගුරුවරුන් දේශගුණික විපර්යාස පිළිබඳ අධ්‍යාපනය පන්ති කාමරවලට ගෙන ඒමට සූදානම් වෙයි



දේශගුණික විපර්යාස ස්මාර්ට් අධ්‍යාපන පද්ධති මුලපිරීම UNESCO හරහා, දේශගුණික විපර්යාස අර්ථවත් ආකාරයෙන් ඉගැන්වීම සඳහා මෙවලම් සහ විශ්වාසය ලබා ගැනීම සඳහා යුනෙස්කෝව ගුරුවරුන්ට සහ ගුරු අධ්‍යාපනඥයින්ට සහාය වේ.

වුති කෝර්න් (Vuthy Khorn) මුලින්ම පන්ති කාමරයට ඉතිහාසය සහ භූගෝල විද්‍යා ගුරුවරයෙකු ලෙස ඇතුළු වූ විට, දේශගුණික විපර්යාස ඔහු උගන්වනවා යැයි සිතූ දෙයක් නොවේ. බොහෝ ගුරුවරුන් මෙන්, වුති දැනටමත් විෂය මාලාවේ ඇති අන්තර්ගතයන් ආවරණය කළ නමුත් එය පුළුල් පාරිසරික අභියෝගවලට සම්බන්ධ කළේ නැත. දේශගුණික විපර්යාස දුරස්ථ හා බිය උපදවන බවක් දැනුනි. "දේශගුණික විපර්යාස ආශ්‍රිත මාතෘකා වල තේරුම කුමක්දැයි මට අදහසක් නොතිබුණි. මම ඒවාට කැමති වුණේ නැහැ. පාරිභාෂිතය ඉතා සංකීර්ණ බවක් පෙනෙන්නට තිබුණි," ඔහු පැහැදිලි කළේය.

කාම්බෝජයේ, දේශගුණික විපර්යාස දෛනික ජීවිතයේ කොටසක්. ගංවතුර, නියඟ සහ අධික තාපය වැඩි වැඩියෙන් ප්‍රජාවන්ට, විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවලට බලපායි. 2022 දී පමණක්, ගංවතුර පළාත් 14 ක පාසල් 280 කට හානි සිදු විය හෝ වසා දැමීමට සිදු වූ අතර, එමඟින් දරුවන්ගේ ඉගෙනීමේ අඛණ්ඩතාව බරපතල අවදානමකට ලක් විය.

ඊට ප්‍රතිචාර වශයෙන්, දේශගුණික විපර්යාස ආශ්‍රිත මාතෘකා අධ්‍යාපන ප්‍රතිපත්ති සහ විෂයමාලා තුළට වැඩි වැඩියෙන් ඇතුළත් වී ඇත. එහෙත් බොහෝ ගුරුවරුන් සඳහා, මෙම තේමාවන් පන්ති කාමර භාවිතයට පරිවර්තනය කිරීම අභියෝගයක් ලෙස පවතී. මෙම පරතරය පියවීම සඳහා දේශගුණික සංකල්ප එදිනෙදා ඉගෙනීමට සම්බන්ධ කරන ප්‍රායෝගික සහ ප්‍රවේශ විය හැකි ප්‍රවේශයන් අවශ්‍ය වේ.

❖ දේශගුණික විපර්යාස අධ්‍යාපනය ඉගැන්වීමේ භාවිතයට ඒකාබද්ධ කිරීම

මෙම වෙනස්වීම් දේශගුණික ස්මාර්ට් අධ්‍යාපන පද්ධති මුලපිරීම් සහාය දක්වයි. මෙම සන්දර්භය තුළ, යුනෙස්කෝව ගුරුවරුන්ගේ ධාරිතාව ශක්තිමත් කිරීමට සහ වැඩමුළු මාලාවක් හරහා දේශගුණික අධ්‍යාපනය පාඩම් සහ පන්ති කාමර භාවිතයට ඒකාබද්ධ කිරීමට - ගුරු අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය ඇතුළු ජාතික හවුල්කරුවන් සමඟ කටයුතු කරයි. ගුරුවරුන් සඳහා මෙය හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කර ඇත. අන්තර්ගතය නිර්මාණය කර ඇති ආකාරය දේශගුණික විපර්යාස අධ්‍යාපනය තේරුම් ගැනීමට පහසු කර ඇති අතර ඉතා සන්දර්භගත කර ඇත. එය මගේ ඉදිරිදර්ශනය සම්පූර්ණයෙන්ම වෙනස් කළේය," වුති අවධාරණය කළේය.

වැඩමුළු අතරතුර, ගුරුවරුන් සහ ගුරු පුහුණුකරුවන් දේශගුණික සංකල්ප ඉවත් කර ඒවා ප්‍රායෝගික ඉගැන්වීමේ මෙවලම් බවට පරිවර්තනය කිරීමට එක්ව කටයුතු කරයි. විද්‍යාත්මක පාරිභාෂික වචන සරල කරන්නේ කෙසේද, පාඩම් සැලසුම් අනුවර්තනය කරන්නේ කෙසේද සහ ඉගෙන ගන්නන්ගේ යථාර්ථයන් සහ දේශීය සන්දර්භයන්ට සෘජුවම සම්බන්ධ ක්‍රියාකාරකම් සැලසුම් කරන්නේ කෙසේද යන්න ඔවුන් ගවේෂණය කරයි.

❖ ව්‍යුක්ත සංකල්පවල සිට සැබෑ ජීවිත පාඩම් දක්වා

මෙම උත්සාහයේ කේන්ද්‍රස්ථානය වන්නේ Battambang ගුරු අධ්‍යාපන විද්‍යාලය වන අතර, එහිදී අධ්‍යාපනඥයින් සහ කථිකාචාර්යවරුන් පූර්ව සේවා සහ සේවාස්ථ ගුරු පුහුණුව සඳහා උපදේශන පැකේජයක් සංවර්ධනය කරමින් සිටින අතර, ගුරුවරුන්ට දේශගුණික සංකල්ප අර්ථවත් පන්ති කාමර පාඩම් බවට පරිවර්තනය කිරීමට උපකාරී වේ. ගණිතය, රසායන විද්‍යාව, සාහිත්‍යය, ඉතිහාසය සහ ශාරීරික අධ්‍යාපනය වැනි විෂයයන් හරහා දේශගුණික විපර්යාස අධ්‍යාපනය ඇතුළත් කිරීම ඉලක්කයයි.

උදාහරණයක් ලෙස, කාම්බෝජයේ ගුරුවරුන් විසින් ගුණ කිරීම පිළිබඳ ගණිත පාඩමකට ශාක මගින් කාබන් ඩයොක්සයිඩ් (CO_2) අවශෝෂණය ගණනය කිරීම වැනි සැබෑ ජීවිත යෙදුම් ඇතුළත් කළ හැකි ආකාරය ගවේෂණය කර ඇත. පාරිභාෂික වචන සරල කිරීමෙන් සහ ව්‍යුක්ත සංකල්ප සැබෑ ලෝක අභියෝගවලට සම්බන්ධ කිරීමෙන්, මෙම ප්‍රවේශයන් ඉගෙනීම වඩාත් ආකර්ශනීය සහ අදාළ කරයි.

"ප්‍රාථමික පාසල් ගුරුවරුන් යනු වෙනසක නියෝජිතයන් ය. අපි ඔවුන්ව දේශගුණික අධ්‍යාපනය තුළ පුහුණු කරන විට, සිසුන් ඔවුන්ගේ ගුරුවරුන්ගෙන් ඉගෙන ගන්නා අතර ඔවුන්ගේ පවුල් සහ ප්‍රජාවන්ට බලපෑම් කරයි, කාම්බෝජයේ වඩාත් ඔරොත්තු දෙන සමාජයක් නිර්මාණය කිරීමට උපකාරී වේ."

රාතා චේ (Battambang ගුරු අධ්‍යාපන විද්‍යාලයේ අධ්‍යක්ෂ)

මෙම ප්‍රවේශය මත ගොඩනඟමින්, වුති දැන් දේශගුණික විපර්යාස ඔහුගේ ඉතිහාස පාඩම් වලට ඒකාබද්ධ කරයි. ඔහු අතීත සිදුවීම් වර්තමාන දේශගුණික යථාර්ථයන්ට සම්බන්ධ කරයි, නියඟය හෝ ගංවතුර වැනි පාරිසරික සාධක කාලයත් සමඟ සමාජවලට බලපා ඇති ආකාරය ගවේෂණය කරන ලෙසත්, ඒ හා සමාන අභියෝග අද ඔවුන්ගේම ප්‍රජාවන්ට බලපාන ආකාරය ගැන මෙනෙහි කරන ලෙසත් ඔහුගේ සිසුන්ගෙන් ඉල්ලා සිටී.

ශ්‍රී ලංකාව වැනි දේශගුණික විපර්යාසවල බලපෑම්වලට වැඩි වශයෙන් නිරාවරණය වන රටක, දේශගුණික විපර්යාස අධ්‍යාපනය පාසල් අධ්‍යාපන පද්ධතිය තුළ තවදුරටත් ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. ගංවතුර, නියඟය, නායයෑම්, අධික උෂ්ණත්වය සහ අනෙකුත් දේශගුණික ආශ්‍රිත ආපදා ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල දරුවන්ගේ පාසල් පැමිණීම, ඉගෙනුම් අඛණ්ඩතාව සහ අධ්‍යාපනික අවස්ථාවන්ට සෘජුවම බලපායි. එබැවින් දේශගුණික විපර්යාස පිළිබඳ දැනුම ලබාදීම පරිසරය පිළිබඳ දැනුවත් කිරීමකට පමණක් සීමා නොවී, දරුවන්ගේ ආරක්ෂාව, ඔරොත්තු දීමේ හැකියාව සහ අනාගත ජීවන කුසලතා වර්ධනය කිරීමේ කොටසක් විය යුතුය. විශේෂයෙන්ම ග්‍රාමීය, වතු සහ දේශගුණික අවදානම් සහිත ප්‍රදේශවල පාසල් දරුවන්ට දේශගුණික විපර්යාසවල බලපෑම් වඩාත් සෘජුව අත්විඳීමට සිදුවන බැවින්, ඔවුන්ගේ දේශීය අත්දැකීම් පාසල් ඉගෙනුම් ක්‍රියාවලිය සමඟ සම්බන්ධ කිරීම වැදගත් වේ. ගුරුවරුන්ට දේශගුණික විපර්යාස පිළිබඳ සංකල්ප සරල භාෂාවෙන් ඉගැන්වීමටත්, විද්‍යාව, භූගෝල විද්‍යාව, ඉතිහාසය, ගණිතය, භාෂා සහ සෞන්දර්ය වැනි විවිධ විෂයන් සමඟ එය ඒකාබද්ධ කිරීමටත් හැකියාව ලබාදීම මෙහිදී වැදගත් වේ. එමෙන්ම, දේශගුණික විපර්යාස අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ "Disaster Risk Reduction, DRR and School Safety, Environmental Education and Sustainable Development" යන ක්ෂේත්‍ර සමඟ සම්බන්ධ කළ හැකිය. එමඟින් දරුවන්ට දේශගුණික අවදානම් හඳුනාගැනීමට, තම පාසල සහ ප්‍රජාව ආරක්ෂා කරගැනීමට, සම්පත් වගකීමෙන් භාවිත කිරීමට සහ දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දෙන ප්‍රජාවන් ගොඩනැගීමට සක්‍රීයව දායක විය හැකිය.

මේ නිසා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ දේශගුණික විපර්යාස අධ්‍යාපනය ශක්තිමත් කිරීම අනාගත පරපුර සඳහා පරිසර දැනුම ලබාදීමක් පමණක් නොව, දේශගුණික අවදානම්වලට සූදානම්, විද්‍යාත්මකව සිතන, වගකීම් සහිත සහ ඔරොත්තු දෙන පුරවැසියන් බිහිකිරීම සඳහා වන ආයෝජනයක් වේ. ඒ අනුව, ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය, පාසල් විෂයමාලා යාවත්කාලීන කිරීම, ප්‍රායෝගික ඉගෙනුම් ක්‍රම හඳුන්වාදීම සහ පාසල්-ප්‍රජා සම්බන්ධතාව ශක්තිමත් කිරීම ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස අධ්‍යාපනය ඉදිරියට ගෙන යාම සඳහා අත්‍යවශ්‍ය පියවර වේ.

ළමුන්ගේ දඟකම යනු

ලොවේ ඉදිරි දැක්ම රඳා පවතින්නේ දරුවන් මතයි. දරුවෝ මොළ කැටි සියුමැලි බැවින් මලකට උපමා කරයි. කුඩා දරුවන් සෑම විටම උත්සහ දරන්නේ ඔවුන්ගේ අභිමානය පරිදි ක්‍රියාකිරීමටය. එයට බාධා පැමිණියහොත් ප්‍රතිචාර ළමයින්ගේ දඟකම 'විනය පිරිහීම' ලෙස හැඳින්වීමට ලද දෙමව්පියන් පුරුදු වී තිබේ.

දරුවන් මෙසේ ප්‍රතිචාර දැක්වීමට කරුණු කිහිපයක් බලපායි. එනම්,

- **පවුල තුළ විනයක් නොමැතිවීම** - දරුවන් තුල විනය පිරිහීමට පවුල තුළ සිටින අනික් සියලු දෙනාම කතාබහ හා ක්‍රියාවන්ගෙන් විනයක් නොමැතිනම් ඒ වටපිටාව තුළ වැඩෙන දරුවාගේම විනය පිරිහීමක් දැකිය හැකිය.

- **දෙමාපියන් දරුවෝ සමඟ පරස්පර විරෝධී ලෙස හැසිරීම** - පවුල තුළ දෙමාපියන් පරස්පර විරෝධී ලෙස හැසිරීම දරුවාගේ විනය පිරිහී යාමට හේතු වේ. ළමුන් තම මුල් වකවානුවේ දී සිය දෙමව්පියන් ආදර්ශයට ගැනීමෙන් ද දරුවන්ද එසේ හැසිරීමට පෙළඹෙති. එසේ නම් දරුවන්ට ආදර්ශමත් ලෙස ජීවත්වීමෙන් ඔවුන් ගුණයහපත් දරුවන් බවට පත් කළ හැක.

- **වැඩිහිටියන් තමන් ගැන සාධාරණ ලෙස නොහැසිරීම** - දරුවන්ට සෑම විටම තරවටු කිරීමෙන් ඔවුන් තමන්ට නීති දමන බව සිතති. සමහර ළමුන් දෙමව්පියන් ඉදිරියේ ඒ නීති වලට අවනත වුවත් දෙමව්පියන් නොමැති විට එම නීති නොසලකා හරිති. මෙවැනි අවස්ථාවල ළමුන් දඟ ළමුන් ලෙස වැඩිහිටියන් සලකති.ක්‍රීඩාවට ශාරීරික හෝ මානසික පුබුදුව සඳහා ඇති ඉඩකඩ හිඟවීමෙන් දරුවන් දඟකිරීමට ප්‍රිය කරති. ඒ සඳහා ඔවුන්ට අවස්ථාව ලබා දියයුතු අතර එය ඔවුන්ගේ වර්ධනයට උපකාරී වේ. දෙමව්පියන් දරුවාගේ මූලික අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර, ඔවුන්ගේ දඟකම් හොඳ චලනයන් විනය පිරිහීමක් ලෙස නොසැකිය යුතුය. දරුවන්ගේ ශක්තිය නිසි ආකාරයට යොමු කිරීමට ඔවුන් අවශය ඉඩ ප්‍රස්ථාව ලබාදිය යුතුය.

- **දරුවන් කෙරෙන් ලබා ගැනීමට අසීරු ආකාරයේ බලාපොරොත්තු තැබීම** - දරුවන්ගේ හැකියාවන් අභිබවන බලාපොරොත්තු ඔවුන් කෙරෙහි තැබීම දරුවාගේ දඟකම් වැඩීවීමට හේතු වේ. දරුවාගේ හැකියාව පිළිගෙන එය ඉටුකර දෙන්න. ඔවුන්ගේ ධාරිතාවට බැහැර දෙයක් ඔවුන්ට කරන්න දෙන්න. දරුවන්ගේ විනය පිරිහීමට ඔවුන්ගේ ආධ්‍යාත්මික අවශ්‍යතා අමතක කර දැමීමද හේතු වේ. උදාහරණයක් ලෙස දරුවන්ට ආදරය, කරුණාව හිඟ වූ විට තමන් අවට සිටින අයගේ අවධානය ලබා ගැනීමට විප්ලව කිරීමට පෙළඹෙති. එමනිසා ඔවුන්ගේ ක්‍රියාකාරකම් තේරුම්ගෙන ඔවුන්ගේ අයිතිවාසිකම් සපුරාදිය යුතුය.

පාට සුවද එකවගේ පිපුණ රෝසමල් බදු දරුවන් මෙම සමාජයට දායාද කිරීම නම් දරුවන්ගේ අවශ්‍යතා හඳුනාගෙන ඔවුන් කෙරෙහි කරුණාව දැක්විය යුතුය. ආදරය, සෙනෙහස නම් සාගරයේ ඔවුන්ට කිමිදීමට ඉඩසලසමු. යහපත් දරුවන් ලොවට දායාද කිරීම බුද්ධිමත් දෙමව්පියන්ගේ යුතුකමකි.

ළමුන්ගේ මානසිකත්වය බිඳීමට හේතු බහුලයි. නිදහස ලැබී කාලයක් ගතවුවද 71/89 රට තුල සිදුවු ගැටුම් 83 කලු ජූලිය උතුරු නැගෙනහිර යුධ ගැටුම් හා සුනාමි,ගංවතුර,නායයෑම්, සුළි කුණාටු වැනි තත්ත්වයන් ළමුන්ගේ පීඩනය විශාල වශයෙන් බිඳ වැටුනු සිදුවීම් වේ.

අප රටතුල ජීවත්වන දරුවන් විශාල සංඛ්‍යාවකගේ දෙමාපියන් මැදපෙරදිග රැකියාවට යොමුවීම හේතුවෙන් මානසික පීඩා විඳිනු ඇත. ඇමරිකාව හා ඉරානය යුද්ධ ප්‍රහාරයෙන් ඉරානයේ බාලිකා පාසලට මියගිය ළමුන් සංඛ්‍යාව 117 ක් වේ. පීඩනයට පත් වූ සංඛ්‍යාව අති විශාල ය. මැදපෙරදිග කලාපයේ රටවල වාසය කරන දරුවන් මිලියන 200 ක් මෙම යුද්ධයෙන් තුළ ජීවත්වේ. අවියෙන් යුධ කරන අය මෙම දරුවන්ගේ නාමයෙන් දිනෙන් දින ඇවිලෙන යුධ ගිනිවලින් තොර සාමය උදාකර දීමට සිත් පහල වේවා.

සාමවිනිසුරු ප්‍රේමබන්දු ජයතිලක,
තිස්සජය ළමා සුබසාධන පදනම, දකුණු පළාත

Board of Directors in CED		
Chairman Mr. Sachitha N.Hewage	Asia Lanka Social Development Co-operation (ALSDC)	768210077
Secretary Mr. Nihal Premasiri	People's Participatory Foundation	702048794
Treasurer Mr. Chaminda Piyasekara	Environment and Community Development Information Center,	714122052
Vice Chairman & Board Member (Sabaragamuwa) Mr. Nishantha Kasthuri	Dehiowita People Development Foundation	773054910
Vice Secretary & Board Member (Uva) Ms. Naguleshwary	Uva Farmers Development Foundation	740816674
Board Member (Western) Mr.K.L Gunarathne	National Pre School Development Foundation	701968482
Board Member (North Central) Mr. K.G.A.S Weerasinghe	Sri Lanka Rural Development Foundation	760672302
Board Member (Central) Mr. Chandana Bandara	Sithuwama Training Education & Development Organization	719936330
Board Member (North West) Mr. Mangala Lal Sathkumara	Child & Youth Development Foundation	772695843
Board Member (Eastern) Mr. M.A.J Riyas	Amanath Social Service Organization	761480759
Board Member (Southern) Mr. Premabandu Jayathilaka	Thissa Jaya Children Welfare Foundation	742676483

අධ්‍යාපන සැලසුම්කරණය සඳහා සහභාගීත්ව ප්‍රවේශය සහ සාමාන්‍ය අධ්‍යාපන අංශ පරිවර්තන රාමුව **(GESTF)** පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන දකුණු පළාතේ දී



අධ්‍යාපන සංවර්ධන සන්ධානය (CED) විසින් අධ්‍යාපන අමාත්‍යාංශය සහ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමඟ එක්ව දකුණු පළාතේ අධ්‍යාපන සැලසුම්කරණ නිලධාරීන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2026 ජූලි 25 වන දින මාතර Grand Rockland හෝටලයේදී පවත්වන ලදී. අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය යන ක්‍රියාවලීන් සඳහා සිවිල් සමාජයේ සහභාගීත්වයේ වැදගත්කම මෙහිදී අවධාරණය කෙරිණි. එමෙන්ම, සාමාන්‍ය අධ්‍යාපන අංශ පරිවර්තන රාමුව (GESTF) පිළිබඳ හැඳින්වීමක් සහ ප්‍රතිඵල පාදක අධ්‍යාපන කළමනාකරණය (Results-Based Management) පිළිබඳ ධාරිතා සංවර්ධන සැසියක් ද පැවැත්විණි. දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකතුමා ඇතුළු අධ්‍යාපන නිලධාරීන් 44 දෙනෙකු සහ CED පළාත් සම්බන්ධීකාරක ප්‍රේමබන්දු ජයතිලක මහතා, පළාත් සාමාජික සංවිධාන නියෝජිතයන් සහ CED කාර්ය මණ්ඩලය මෙම වැඩසටහනට සහභාගී වූහ. ආචාර්ය ජයන්ත බාලසූරිය මහතා සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා සැලසුම් අංශයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ඒ.එච්.එම්. ෆාසිල් මහතා සම්පත් දායකත්වය ලබා දුන්හ. මෙම වැඩසටහන රාජ්‍ය අධ්‍යාපන ආයතන සහ සිවිල් සමාජ සංවිධාන අතර සහයෝගිතාව ශක්තිමත් කිරීමටත්, වඩාත් සහභාගීත්වයෙන් යුතු, විනිවිදභාවයෙන් යුත් හා ප්‍රතිඵලදායක අධ්‍යාපන සැලසුම්කරණයක් ප්‍රවර්ධනය කිරීමටත් වැදගත් අවස්ථාවක් විය.

කෘත්‍රිම බුද්ධිය සහ අධ්‍යාපනය පිළිබඳ තරුණ ප්‍රජාව සවිබල ගැන්වීමේ වැඩසටහන

අධ්‍යාපන සංවර්ධන සන්ධානය (Coalition for Educational Development - CED) විසින් සංවිධානය කරන ලද කෘත්‍රිම බුද්ධිය සහ අධ්‍යාපනය පිළිබඳ තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන 2026 ජූලි මස 21 වන දින නාරාහේන්පිට CIPM ආයතනයේදී සාර්ථකව පැවැත්විණි. CED සාමාජික සංවිධාන නියෝජනය කරමින් තරුණ තරුණියන් පිරිසක් මෙම වැඩසටහන සඳහා සහභාගී වූ අතර, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කෘත්‍රිම බුද්ධිය භාවිත කිරීමේ හැකියාවන් පිළිබඳ ඔවුන්ගේ දැනුම හා අවබෝධය වර්ධනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ විය.



වර්තමානයේ වේගයෙන් වෙනස් වන ඩිජිටල් තාක්ෂණික පරිසරය තුළ ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීම, දැනුම ලබාගැනීමේ අවස්ථා පුළුල් කිරීම, නිර්මාණශීලීත්වය වර්ධනය කිරීම සහ ගැටලු විසඳීම සඳහා කෘත්‍රිම බුද්ධිය වැදගත් මෙවලමක් බවට පත්ව ඇත. ඒ අනුව, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ තාක්ෂණය මඟින් ඇති කරනු ලබන අවස්ථා, අභියෝග සහ එය වගකීම්සහගතව භාවිත

කිරීම පිළිබඳ තරුණ ප්‍රජාව දැනුවත් කිරීම කෙරෙහි මෙම වැඩසටහනේදී අවධානය යොමු කෙරිණි.

ආචාර්ය අරෝෂා මඩිවෙල මහත්මියගේ සම්පත් දායකත්වයෙන් පැවති මෙම වැඩසටහනේදී කෘත්‍රිම බුද්ධිය පිළිබඳ මූලික සංකල්ප, විවිධ මෙවලම් සහ ඒවායේ ප්‍රායෝගික භාවිතයන් පිළිබඳව සහභාගිවන්නන් දැනුවත් කරන ලදී. එමෙන්ම, ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රියාවලියට තාක්ෂණය යොදාගත හැකි ආකාරය, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ එහි වර්තමාන භාවිතය, අදාළ ප්‍රතිපත්තිමය කරුණු සහ තාක්ෂණය සදාචාරාත්මකව, වගකීම්සහගතව හා සාධාරණව භාවිත කිරීමේ වැදගත්කම පිළිබඳව ද සාකච්ඡා කෙරිණි. මෙම වැඩසටහන තුළින් තරුණ ප්‍රජාවගේ ඩිජිටල් දැනුම, ප්‍රායෝගික කුසලතා සහ විවේචනාත්මක චින්තන හැකියාවන් වර්ධනය කරගැනීමට වටිනා අවස්ථාවක් සැලසිණි. වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා සිය දැනුම හා අත්දැකීම් බෙදාගත් ආචාර්ය අරෝෂා මඩිවෙල මහත්මියටත්, උනන්දුවෙන් හා සක්‍රීයව සහභාගී වූ CED සාමාජික සංවිධානවල සියලුම තරුණ නියෝජිතයන්ටත් අධ්‍යාපන සංවර්ධන සන්ධානය සිය ස්තුතිය පිරිනමයි.

අධ්‍යාපන සංවර්ධන සන්ධානය මෙවරත් ලෝක ළමා දින උත්සවය සැමරීමට සැරසෙයි.

අධ්‍යාපන සංවර්ධන සන්ධානය සියලු දෙනාටම ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා ක්‍රියාත්මක වන අතර සෑම වසරකම ලෝක ළමා දින උත්සවය සාමාජික සංවිධාන හරහා උත්කර්ෂයෙන් සමරනු ලබති. ඒ අනුව 2026 වසරේදීත්, ලෝක ළමා දින උත්සවය සැමරීම සඳහා අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම සාමාජික සංවිධානවලට වැඩසටහන් සංවිධානය කිරීම වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන ලබාදීමට සැලසුම් කර ඇත. 2026 වසරේ ලෝක ළමාදින තේමාව ලෙස UNICEF ආයතනය පෙන්වා දෙන්නේ "මගේ දවස, මගේ අයිතිවාසිකම්, මගේ අනාගතය" ලෙසයි. එසේම ශ්‍රී ලංකාවේ මෙවර ලෝක ළමා දින තේමාව වුයේ "මනසින් සවිමත්, දරුවන් පොහොසත් " යන්නය. එම තේමාවන්ට සමගාමීව ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර ඇත. මීළඟ සඟරාවෙන් වැඩිදුර තොරතුරු ඔබ වෙත බෙදා ගැනීමට අපේක්ෂා කරනු ලබයි.

A GRATE SRILANKAN WOMAN LEADER



We have heard Many women leaders in the world and in Sri Lanka as well. This woman leader is from our Motherland Sri Lanka itself. She did her duty silently for the sake of the country. She is Mrs. ANGELA WIJESINGHE . She was a talented Chemistry

teacher who worked in private- sector schools in Sri Lanka. She could promote the name SRILANKA worldwide through "Education International" the biggest World Teachers Organization.

She was the President of All Ceylon Union of Teachers (ACUT) and was the president of SARRC Teachers Federation (STF). Not only that, but also a Board Member of Regional Committee of-Asia Pacific Region -EI. There, she raised her voice to enhance the quality Education in the country and in the whole region. In addition she stood on behalf of the women to protect women rights in the country and all over the Asia Pacific region as well. One of her outstanding qualities was the courage to raise her voice boldly whenever she witnessed any injustice being done to the country. Even in Sri Lanka she fought for the women rights whenever the women faced any injustice in the society.

Angela was not only a teacher leader but also a social well-wisher. By Conducting workshops she tried to raise women awareness of their rights so that to prevent from various forms of harassments and abuse. Finally I would like to share Following extract from the words of the former Chief Co-ordinator of EIAPR Ms. Shahi Balasingh regarding her.

"I am deeply saddened hearing the sad and heart-breaking news of our dearest Angela is no more with us. With Angela passing away meaning an end of an era of her great contribution to the teaching profession and to the educational fraternity. A simple, smiling and highly regarded and devoted person who dedicated her life in serving the education, children and education unions will never be forgotten by us and will always rule ourhearts. She will be remembered by her diligent work as well as for her leadership"

Mrs. Malathi. M. Senevirathna
Union of Sri Lanka Teachers Solidarity

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ පළාත් හඬ, ජාතික සංවාදයට



ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කටයුතු මේ වන විට අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සිදු කරමින් පවතී. මෙම ක්‍රියාවලියේදී සිවිල් සමාජ සංවිධානවල අදහස් හා යෝජනා ලබාගැනීම සඳහා වත්මන් රජය විසින් ද අවස්ථාව සලසා දෙන ලදී. ඒ අනුව, අධ්‍යාපන සංවර්ධන සන්ධානය (CED) විසින් ජාතික මට්ටමින් වැඩසටහන් දෙකක් සහ පළාත් මට්ටමේ වැඩසටහන් රැසක් Education Out Loud - EOL යටතේ ක්‍රියාත්මක කරමින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය සඳහා සිවිල් සමාජ අදහස්, අත්දැකීම් හා යෝජනා එක්රැස් කිරීමට මැදිහත් විය. එහි එක් වැදගත් පියවරක් ලෙස 2026 ජූලි සහ අගෝස්තු මාසවලදී ශ්‍රී ලංකාවේ පළාත් පහක් ආවරණය වන පරිදි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ පළාත් සංවාද මාලාවක් CED විසින් සාර්ථකව පවත්වන ලදී. ජාතික මට්ටමේ වැඩසටහන් හිටපු විභාග කොමසාරිස් කේ. එම්.එන්. බණ්ඩාර මහතා විසින් අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, මාධ්‍යය නියෝජිතයන්, රාජ්‍ය නොවන සංවිධාන යන පාර්ශවකරුවන් සමග කොළඹ දී පැවැත්විණි.

එසේම පළාත් මට්ටමේ වැඩසටහන්, අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ පළාත් සම්බන්ධීකරණ නිලධාරීන් විසින් සාර්ථකව සංවිධානය කර තිබුණි. ඒ අනුව, 2026 ජූලි 07 වන දින පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී උතුරු මැද පළාත් සංවාදය ද, ජූලි 08 වන දින මහනුවරදී මධ්‍යම පළාත් සංවාදය ද, ජූලි 10 වන දින මාතරදී දකුණු පළාත් සංවාදය ද, ජූලි 22 වන දින කුරුණෑගලදී වයඹ පළාත් සංවාදය ද, අගෝස්තු 20 වන දින කෑගල්ලේදී සබරගමුව පළාත් සංවාදය ද පැවැත්විණි. මෙම සංවාද සඳහා රාජ්‍ය පරිපාලන නිලධාරීන්, රජයේ අධ්‍යාපන බලධාරීන්, CED සාමාජික සංවිධාන නියෝජිතයන්, මාධ්‍යවේදීන් සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු විවිධ පාර්ශ්වකරුවන් සහභාගී වූහ.

මෙම පළාත් සංවාද මාලාව තුළින් ලබාගත් අදහස්, අත්දැකීම් සහ යෝජනා සියල්ල පදනම් කරගනිමින් අධ්‍යාපන සංවර්ධන සන්ධානය (CED) විසින් සකස් කරන ලද යෝජනාවලියක් අවසන් වශයෙන් සම්පාදනය කරන ලදී. එම යෝජනාවලිය ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට සිවිල් සමාජයේ දායකත්වය ලබාදීමේ අරමුණින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සහ අධ්‍යාපන අමාත්‍යාංශය වෙත නිල වශයෙන් භාරදීමට කටයුතු කරන ලදී. ඒ තුළින් පළාත් මට්ටමේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින සැබෑ අවශ්‍යතා, අභියෝග සහ පාර්ශ්වකරුවන්ගේ යෝජනා ජාතික ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තුළ පිළිබිඹු කරමින්, සියලු දරුවන්ට සාධාරණ, ගුණාත්මක හා අන්තර්කරණීය අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා CED සිය ප්‍රතිපත්තිමය මැදිහත්වීම අඛණ්ඩව ඉදිරියට ගෙන යාමට අපේක්ෂා කරයි.



අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැයකරණය සහ මූල්‍යකරණය පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන



අධ්‍යාපන සංවර්ධන සන්ධානය (Coalition for Educational Development - CED) විසින් සංවිධානය කරන ලද අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැයකරණය (Gender-Responsitive Budgeting) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී මූල්‍යකරණය (Gender-Responsive Financing) පිළිබඳ වැඩසටහන 2026 අගෝස්තු මස 22 වන දින කොළඹ Ecumenical Institute for Study and Dialogue ආයතනයේදී සාර්ථකව පැවැත්විණි.

ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින CED සාමාජික සංවිධාන නියෝජනය කරමින් සහභාගිවන්නන් එක්වූ මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වූයේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැයකරණයේ හා මූල්‍යකරණයේ වැදගත්කම පිළිබඳ සාමාජික සංවිධානවල දැනුම හා අවබෝධය වර්ධනය කිරීමයි. සම්පත් දායකත්වය සපයමින් වැඩසටහන මෙහෙයවූ සිසිර කුමාරසිරි මහතා විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී අයවැයකරණය හා මූල්‍යකරණය පිළිබඳ වැදගත් කරුණු සහ ප්‍රායෝගික අත්දැකීම් සහභාගිවන්නන් සමඟ බෙදාගන්නා ලදී. අන්තර්ක්‍රියාකාරී සාකච්ඡා සහ දැනුම හුවමාරු කරගැනීම් තුළින් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය, අයවැය සකස් කිරීම සහ සම්පත් වෙන් කිරීමේ ක්‍රියාවලීන් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය කරුණු ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාව, ඒ ආශ්‍රිත අභියෝග සහ අවස්ථා පිළිබඳව ද සාකච්ඡා කෙරිණි. මෙම සාකච්ඡා තුළින් අධ්‍යාපන මූල්‍යකරණය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව, සාධාරණත්වය, සියලු දෙනා ඇතුළත් කරගැනීම, විනිවිදභාවය සහ වගවීම ශක්තිමත් කිරීම සඳහා ප්‍රායෝගික අදහස් හා නිර්දේශ රැසක් ඉදිරිපත් විය.

වැඩසටහන සඳහා සිය වටිනා දැනුම, අත්දැකීම් සහ විශේෂඥ දායකත්වය ලබාදුන් සිසිර කුමාරසිරි මහතා වෙත අධ්‍යාපන සංවර්ධන සන්ධානය සිය හෘදයාංගම ස්තුතිය පිරිනමයි. එමෙන්ම, මෙම වැඩසටහන සඳහා සක්‍රීයව සහභාගී වෙමින් වටිනා අදහස් හා අත්දැකීම් බෙදාගත් සියලුම CED සාමාජික සංවිධාන සහ සහභාගිවන්නන් වෙත ද සිය කෘතඥතාව පළ කරයි.

මීළඟ කලාපයෙන්, ඔබේ හඬට, අපෙන් පිටුවක්....

ඔබ ප්‍රදේශයේ අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ප්‍රවීනයෙක් වන ඔබට,
අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධ ලිපි, පද්‍ය, ජයග්‍රහණ මෙන්ම ඔබ ජීවත් වන ප්‍රදේශයේ සුවිශේෂ අවස්ථාවන් අපට කියන්න. මීලඟ හඬ සඟරාව සඳහා ඔබේ නිර්මාණ 2026 නොවැම්බර් 15 දිනට පෙර info@cedsrilanka.org මෙම ලිපිනයට එවන්න.

සිංහල ලිපි : Font – FMAbhaya, Size 12
ඉංග්‍රීසි ලිපි : Font – Times New Roman, Size 12



අධ්‍යාපන සංවර්ධන සන්ධානය
නො. 17, ධර්මපාල පෙදෙස, රාජගිරිය
web: cedsrilanka.org
දුරකතනය : 0112887642